# කොවිඩ් - 19 - සති පාසල 2021

## සබරගමු පළාත - නිවිතිගල අධ්‍යාපන කලාපය

## 9 ශ්‍රේණිය - ඉතිහාසය 2021

8 වන සතිය 2021 ඔක්තෝබර් 18 - 2021 ඔක්තෝබර් 24

ඒකකය - 06 - නිදහසින් පසු ශ්‍රී ලංකාව

ක්‍රියාකාරකම :- 01 ශ්‍රී ලංකාවට නිදහස ලැබීම පිලිබඳ සොයා බලමු

හැඳින්වීම :- ක්‍රි. ව. 1815 දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යන්ට යටත් වීමෙන් පසු වසර 133 ක පමණ කාලයක් අපරට බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක්ව පැවතිනි. පසුව 1947 සෝල්බරි ප්‍රතිසංස් කරණය මෙරටට හිමි වීමෙන් පසුව 1948 පෙබරවාරි මාස 04 වන දින මෙරටට නිදහස හිමි විය. පසුව ක්‍රි. ව. 1972 ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වූ අතර 1978 මෙරටට දෙවන ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දෙනු ලැබිය. එසේ නිදහස දිනාගැනීමත් ඉන්පසුව දේශපාලනික ක්ෂේත්‍රයතුල ඇතිවූ වෙනස්කමක් පිලිබඳ මෙහිදී අවදානය යොමු කෙරේ.

- ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස්

පියවර 1 :- පිටු අංක 116 සිට 117 දක්වා හොඳින් කියවා ගන්න

පියවර 2 :- නව ඒකකයේ තේමාව සටහන් කරගෙන ඉහතින් දීඇති හැඳින්වීම එහි සටහන් කරගන්න.

පියවර 3 :- පහතින් දීඇති ප්‍රශ්නාවලිය සඳහා පසුව පිළිතුරු සපයන්න පිළිතුරු සැපයීමේදී ප්‍රශ්ණ ලියා පිළිතුරු සැපයීම වැදගත්.

ප්‍රශ්නාවලිය :-

01. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පවත්වන ලද ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වූ වර්ෂය දක්වන්න .

02. එම පාර්ලිමේන්තු මැතිවරණය තුලින් තෝරා පත්කර ගැනීමට අපේක්ෂා කල මන්ත්‍රී අසන ගණන කීයද?

03. ලංකාවේ ප්‍රථම අගමැති වරයා කව්රුන්ද ?

04. 1947 පාර්ලිමේන්තු මැතිවරණයේ ජයගත් පක්ෂය හා දිනාගත් ආසන ගණන කීයද?

05. අගමැති D. S. සේනානායක මහතා බ්‍රිතාන්‍යන් සමග අත්සන් කල ගිවිසුම් මොනවාද ?

06. 1948 මෙරටට නිදහස ලබා දීම සඳහා ගෙන ආ පනත නම්කරන්න

07. 1947 මහ මැතිවරණය තුල මන්ත්‍රී ආසන 95 බෙදී ගිය ආකාරය ලියා දක්වන්න.

සැකසුම :- උදාර අරවින්ද - නිවිතිගල අධ්‍යාපන කලාපය - ර/කලවන ජාතික පාසල